## මේ වෛරයේ හා ද්වේෂයේ හෝරාවයි

*මෙල්බන් ගුවන් විදුලියේ නිලවරණය ළඟයි*

*ලියා දන්වන වග යි*

දෙවසරකට පසු මෙල්බන් සිංහල ගුවන් විදුලියේ නිලවරණය ළං වෙමින් තිබේ. මේ ඊනියා නිලවරණය අද වන විට කොයි තරම් පහත් තත්වයකට ඇද වැටී තිබේදැයි මදක් කල්පනා කර බලන්නට සුදුසු කාලයයි මේ.

ගුවන් විදුලිය පවත්වාගෙන යාම සඳහා අලුතින් නිලධාරි මණ්ඩලයක් පත්කරගැනීම වසර දෙකකට වරක් සිදුවෙයි. සැබැවින්ම සිදුවිය යුත්තේ මේ සඳහා ඊට සුදුසුකම් ඇති සහ දක්ෂතාව ඇති පිරිසක් පත්කරගැනීමය. එහෙත් අද වන විට මෙය අතින් සල්ලි දමා ජන්ද එකතු කරනා අති මහත් ජුගුප්සාජනක ව්‍යාපාරයක් බවට පත් ව ඇති බව දකින විට දැනෙන්නේ මහත් කණගාටුවකි.

දවසින් දවස පිරිහෙමින් පවතින ගුවන් විදුලියේ තමන්ගේ බලය රැක ගැනීම සඳහා ඩොලර් දහස් ගණනින් අතින් වියදම් කර සාමාජිකයන් බැන්දවීමෙන් නොනැවතී තමන්ට එකඟ නොවන මිනිසුන්ගෙන් පුද්ගලිකව පළිගන්නට තරම් අද වන විට මේ වියරු මිනිස්සු කටයුතු කරමින් සිටිති. මේ බව මේ සමාජය දැන ගත යුතු ය. මේ වන විට තමන්ට එකඟ නොවන මිනිසුන්ගේ ජීවනෝපායන් නැති කර දමන්නට පිඹුරුපත් ලියන්නට තරම් මේ මිනිසුන් වෛරයෙන් ද්වේෂයෙන් කෝපයෙන් වියරු වැටී සිටින ආකාරය දකින විට මේ සමාජය යමින් තිබෙන්නේ කොයිබටදැයි කණගාටුවක් ඇතිවෙයි.

නාවකාලික ආහරණයක් වන ගුවන් විදුලියේ බලය ලබාගන්නට තවත් මිනිසකුගේ රැකියාවක් නැති කර ඔහුගේ දරු මල්ලන් පාරට බස්සවන්නට කටයුතු කරන්නට තරම් දුෂ්ඨ මානසිකත්වයක් ඇති මේ මිනිසුන් කලා කරුවන් වන්නේ කෙලෙසද? මේ මිනිසුන් වෙනුවෙන් බස් වල නැගී පැමිණ ඔවුන්ට ජන්දය දෙන්නට හදවතක් ඇති මිනිසුන් වශයෙන් ඔබට හැකියාවක් තිබෙයි ද?

මෙතරම් පහත් මානසිකත්වයක් ඇත්තවුන් නැවත නැවතත් සමාජයේ වැදගත් තැන් වලට පත් කර යැවිය යුතු ද? බුද්ධිමත් මිනිසුන් සිටි නම් කල්පනා කළ යුතු වන්නේ එයයි.

හිතවත් කම් වලට හෝ වේවා වෙනයම් ලාබ ප්‍රයෝජනයකට හෝ වේවා අයුක්තියට, වෛරයට, ද්වේෂයට, කුහක කමට, ක්‍රෝධයට අත හිත දෙන්නට ඔබට හිත හදා ගන්නට හැකි ද?

සංස්කාරක

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .


**සන්නස**
**අන්තර්ජාලයෙන් කියවන්න**
www.sannasa.net

# ජනතා කැමැත්ත?

## ධුර කාලය

මහජන ඡන්දයෙන් ජනාධිපතිවරයා පත් කර ගැනීම පළමුවෙන් ම අරුැඹුණේ ඇමරිකා එක්සත් ජනපදයේ ය. ඒ 1776 විප්ලවයෙන් පසුවය. ඊට දසක කිහිපයකට පසු ෆ්‍රැන්ක්ලින් ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරණ ක්‍රමය නීතිගත වි ය. එම ව්‍යවස්ථා සංශෝධන අනුව ජනාධිපතිවරයෙකුගේ ධූර කාලය වසර 4කට සීමා වුව ද එක පුද්ගලයෙකුට ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීමට ඇති අවස්ථා ගණන සීමා නොවිණි. 1932 දී ජනාධිපති පදවියට පත් ෆ්‍රැන්ක්ලින් රුස්වෙල්ට් 1932, 1936, 1940 සහ 44 යන සිවු වතාවේ ම ජනාධිපතිවරණ ජයගත්තේ ය. සිව්වන ජයග්‍රහණයෙන් මාස කිහිපයකට පසුත් රුස්වෙල්ට් මහතා අභාවප්‍රාප්ත වීම නිසා උප ජනාධිපති ක්‍රෑමන් මහතා ඒ හිඩැස පිරවීම සඳහා ව්‍යවස්ථානුකූලව පත්වූවා පමණක් නොව 1948 දී ද ජනාධිපතිවරණයෙන් ජය ගත්තේ ය.

1940 දසකය ඇරැඹෙන විට ජනාධිපතිවරයෙකුට තරඟය සඳහා ඉදිරිපත් වීමට හැකි අවස්ථා ගණන සීමා විය යුතුය, යන ප්‍රබල මතයක් ඩෙමොක්‍රටික් හා රිපබ්ලිකන් යන පක්ෂ දෙකේම මතුවී තිබිණ. ක්‍රෑමන් මහතා ද, ඒ මතයට නැඹුරුව සිටි බව එදා විචාරකයන්ගේ මතය විය.

ඒ හේතුව නිසා හෝ වෙනත් හේතුන් නිසා හෝ එක පුද්ගලයෙකුට ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීමට ඇති අවස්ථා දෙවරකට පමණක් සීමා කිරීමට ව්‍යවස්ථා සංශෝධනයක් සම්මත කරගන්නා ලදී.

දැන් අපි එක්සත් ජනපදයේ ව්‍යවස්ථාව අමතක කොට මේ රටේ 77 ව්‍යවස්ථා සංශෝධනය වෙතට හැරෙමු. '1977 ජයවර්ධන ව්‍යවස්ථාව' හඳුන්වාදෙන අවස්ථාවේ දී එවකට වෙළඳ ඇමති ලලිත් අතුලත්මුදලි මහතා ප්‍රකාශ කළේ එක්සත් ජනදයේ සහ ප්‍රංශයේ ව්‍යවස්ථාවන්හි ඇති 'හොඳම කොටස්' උපයෝගී කරගෙන නව ව්‍යවස්ථාව සම්මත කරගන්නා බව ය.

එසේ වුවද එම ව්‍යවස්ථා දෙකට අහලින් වත් ගොස් නැති ඒකාධිපති වියරුවකට මඟ පෑදෙන 'බහු භූත' වගන්ති කිහිපයක් 77 ශ්‍රී ලංකා ව්‍යවස්ථාවට අන්තර්ගත වී ය. මේ ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයෙකුගේ ධූර කාලය අවුරුදු 6කට සීමාවන අතර එක පුද්ගලයෙකුට ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීමට ඇති අවස්ථා ගණන දෙකකට සීමා කරන ලදී.

මේ ව්‍යවස්ථා විවේචනය කරමින් දේශන කිහිපයක් පැවැත් වූ දේශපාලන ප්‍රාඥයෙකු වූ ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා සිරිත් පරිදි තම කතාවට විනෝදය හා සාහිත්‍යයද එකතු කළේය. ආචාර්ය පෙරේරා මෙසේ කී ය.

"අගමැතිවරයාගේ වයස නම් 71 යි. තව අවුරුදු 12කින් උන්නැහේට 83ත් ඉවරයි. ඉතිං ගණන් බලන්න ඇති 90 ලබන කල් පදවිය දැරීම දුෂ්කර නිසා 83න් විශ්‍රාම යන එක හොඳයි කියලා ඒ අනුව කාලය අවුරුදු 120 සීමා කරන්න ඇති."
එහෙත් ජයවර්ධන මහතාගේ බලාපොරොත්තු 'කලු වලාකුළකින්' වැසී යන්නට පටන් ගත්තේ 81 වර්ෂය අවසානයේ ය. රහස් පොලිස් සමීක්ෂණ වාර්තා අනුව බණ්ඩාරනායක මැතිනියගේ ජන්ද අයිතිය නිශ්ක්‍රීයව තිබුණත් කවුරුන් හෝ ප්‍රබල අපේක්ෂකයෙකු ඉදිරිපත් වුවහොත් තව වසර දොකක් ගතවන කාලයේදී ප්‍රබල තරඟයක් ඇති වන බව ය.

මේ වාර්තා පිළිගත් ජයවර්ධන රජය මේ තර්ජනයෙන් ගොඩ ඒම සඳහා කල් නො යවා ජනාධිපතිවරණයක් පැවැත්විය යුතු බවට තීරණයකට එළැඹුණේ ය.

ඒ අනුව ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කරන ලදී. එම සංශෝදනයෙන් කියවුණේ ජනාධිපති පදවිය දරන පුද්ගලයා අවුරුදු 4කින් පසු තමාම තවත් ජනාධිපතිවරණයකට ඉදිරිපත් වන්නේ නම් ඔහුට එසේ කළ හැකි බව ය. මේ ව්‍යවස්ථා සංශෝධනය අනුව (1977 පෙබරවාරි 4 දා දිවුරුම් දුන් තමාගේ නිල කාලය අවසන් කොට) යළිත් සය වසරක් සඳහා තරඟ වදින බව ප්‍රකාශයට පත් කළේ ය. ඒ අනුව 1982 සැප්. 17 දා (ජයවර්ධන මහතාගේ 76 වන උපන් දිනයේදී) නාම යෝජනා පත්‍ර භාර ගැනීම ප්‍රකාශයට පත් කරන ලදී. දැන් රටේ සැලකිල්ලට භාජනය විය යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදී රටක ජනතාවට තමන්ගේ රැවිය හා අභිමතය අනුව නම නායකයන් තෝරා ගැනීම සීමා කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ද යන්න යි.

ලෝකයේ විශාලම ප්‍රජාතන්ත්‍රවාදී දේශය නමින් හැඳින්වෙන්නේ යාබද ඉන්දියාවයි. ඉන්දියානු ජනතාව 1947 සිට 1962 දක්වා මැතිවරණ 4කදී ම අගමැති පදවියට තෝරා පත්කර ගත්තේ ශ්‍රී ජවහල්ලාල් නේරු ය.

1967 මැයි මසයේ මිය යන තුරු ඔහු එම පදවිය නියෝජනය කළේය. 1966 දී අගමැති පදවියට පත් වූ ඉන්දිරා ගාන්ධි 1967, හා 71 මැතිවරණ වලින් ජයගෙන 77 දී පරාජය වී යළිත් 8 දී ජය ගත්තේය.
දේශයේ නායකත්වය හැර පාර්ලිමේන්තු සම්ප්‍රදාය දෙසට හැරෙමු.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට සෑම මැතිවරණයකට ම ඉදිරිපත් වී ජනතා කැමැත්ත උරගා බැලීමට තහන්වියක් නැත.

**උදාහරණ කිහිපයක් බලමු.**

මැදවච්චිය මන්ත්‍රීධූරයට පත් වූ මෛත්‍රීපාල සේනානායක මහතා 1947 සිට 89 දක්වා සෑම මැතිවරණයකින් ම ජය ගත්තේ ය. ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා 1936, 47, 52, 56, 60 මාර්තු, 60 ජූලි, 65 සහ 70 යන සියලුම මැතිවරණවලින් ජය ගත්තේ ය.

පීටර් කෙනමන් මහතා 1947 සිට 77 දක්වා මැද කොළඹ නියෝජනය කළේ ය.

දෙවන පෙළ නායකයන් වූ බර්නාඩ් සොයිසා, පී.බී.පී. කළුගල්ල, ටී.බී. තෙන්නකෝන්, දයා පැස්කුවල් වී ඇන් නවරත්නම් ආදීන් ගැන සඳහන් කළ හැකි ය.

කෙසේ වුවද අද මතු වී ඇති ප්‍රශ්නය වන්නේ ජනාධිපති ධූරය සඳහා වේවා පාර්ලිමේනතු මන්ත්‍රී ධූරයක් සඳහා වේවා ජනතාවට සිය කැමැත්ත ප්‍රකාශ කිරීමට ඇති අයිතියට කාලසීමා හා බන්ධන ව්‍යවස්ථාධායකයට ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් තිබේද යන්නය.

ප්‍රවීන මාධ්‍යවේදී
ඇස් පියසේන


සන්නස
නව සහශ්‍රයට SANNASA

**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax : 03 3796 4241

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ඡායා රූ / Photography**
ප්‍රසන්න කුරුකුලරත්න Prasanna Kurukularatna

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සමබන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**ACT**
Asoka Nimalasiri
0400 429 031